උඩරට ගෙවත්තේ
සල්ලි ගස

# සාදික්කා

- වගා කිරීම
- වගා නඩත්තුව
- අස්වනු සැකසීම

- වගාවට පෙර ගල් වැටි, කාණු හා ජීවී වැටි යන පාංශු හා ජල සංරක්ෂණ උපක්‍රම යොදා ඔබේ ඉඩම සංවර්ධනය කරන්න.
- වැඩි ආදායමක් සඳහා යහපත් කෘෂිකාර්මික හා නිෂ්පාදන පිළිවෙත් යොදා පරිසර හිතකාමීව වගාව මනාව නඩත්තු කරන්න.

NUTMEG

*Myristica fragrans*



වැඩි විස්තර දැනගන්න
**විමසන්න**

**අපනයන කෘෂිකර්ම ව්‍යාප්ති නිළධාරි**
සෑම බදාදා දිනකම ප්‍රදේශයේ ගොවිජන සේවා මධ්‍යස්ථානයේ දී

**සහකාර අධ්‍යක්ෂ**
අපනයන කෘෂිකර්ම දිස්ත්‍රික් කාර්යාල වල දී

**අපනයන කෘෂිකර්ම මාධ්‍ය හා සන්නිවේදන අංශය**
පේරාදෙණිය. දුරකතන අංක 0812-388651

dea.information2017@gmail.com
www.exagri.info


**අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**
1095, සිරිමාවෝ බණ්ඩාරනායක මාවත, පේරාදෙණිය. දුරකතන 081-2388651



සැකසුම : මාධ්‍ය හා සන්නිවේදන අංශය

## හැඳින්වීම

ඓතිහාසික මහනුවර ගෙවත්තේ (Kandyan Forest Garden) කප්රුක ලෙස නම් ලද සාදික්කා බෝගය සම්භවයවී ඇත්තේ ඉන්දුනීසියාවේ මොලුකා දූපතයේය. ශ්‍රී ලංකාවේ ද උඩරට තෙත් දේශගුණික කළාපයේ සාදික්කා සාර්ථකව වගා කෙරේ. වර්තමානයේ දිවයිනේ සාදික්කා වගා වපසරිය අක්කර 2,500කි. එහි වාර්ෂික නිෂ්පාදනය මෙ.ටො. 3,000ක් පමණ වේ. මේ සඳහා මහනුවර, මාතලේ, කෑගල්ල හා කුරුණෑගල යන දිස්ත්‍රික්ක දායක වේ. මෙම බෝගයෙන් සාදික්කා බීජ හා එම බීජ වසා දැලක් ලෙස වූ වසාවාසි අස්වනු ලෙස ලැබේ. රසකාරක හා ආයුර්වේද ඖෂධ ලෙස විශාල වානිජ වටිනාකමක් ඇති සාදික්කා කර්මාන්තයෙන් ඉහළ ආදායමක් ලබාගැනීමට නම් යහපත් කෘෂිකාර්මික හා නිෂ්පාදන පිළිවෙත් අනුගමනය කළ යුතු වේ. සාමාන්‍යයෙන් මෙම බෝගය තනි වගාවක්, ගෙවතු ආශ්‍රිතව මිශ්‍ර වගාවක් මෙන්ම පොල් වතු ආශ්‍රිතව අතුරු වගාවක් ලෙස ද සාර්ථකව වගා කළ හැකිය.

## සාදික්කා වගාව සඳහා සුදුසු පරිසර තත්ව

| | |
|---|---|
| පස | ගැඹුරු මද ආම්ලික ජලය බැස යන කාබනික ද්‍රව්‍ය බහුල වැලි මිශ්‍ර මැටි පස. |
| වර්ෂාපතනය | මි.මී. 1,500 - 2,500 අතර |
| සාමාන්‍ය උෂ්ණත්වය | 20 - 30 $^{0}$C |
| තද සුළං අහිතකරය | |

## සාදික්කා රෝපන ද්‍රව්‍ය නිෂ්පාදනය

**බීජ ලබාගන්නා මව් ශාකයේ ලක්ෂණ**

වසරකට ගෙඩි 10,000කට වඩා නිපදවීම, අමු ගෙඩියක බර ග්‍රෑම් 30ට වැඩිවීම, අමු ඇටයක බර ග්‍රෑම් 10ට වැඩිවීම, අමු වසාවාසියේ බර ග්‍රෑම් 01 වැඩිවීම.

## බීජ රෝපනය කිරීම

මේරීම නිසා ඵලාවරණය පිපිරීමෙන් විවෘත වූ ඒකාකාර තද දුඹුරු පැහැයෙන් යුත් බීජ සුදුසු වේ. එම බීජවල ප්‍රරෝහන ශක්තිය දින කිහිපයකින් අඩුවී යයි. බීජාවරණය මදක් පළුදු කර හෝ රළු මතුපිටක අතුල්ලා තුනී කිරීමෙන් පැළවීම පහසු කර ගත හැකිය. සාදික්කා බීජයේ ඇති සුදු පැහැති දාරය පොළව දෙසට යොමු කර තිරස් අතට තැන්පත් කළ යුතුය. බීජ අතර හා පේලි අතර පරතරය අඟල් 01ක් ලෙස වැලි තවානේ තබා තුනී වැලි තට්ටුවකින් වසන්න. පත්‍ර දෙකක් වර්ධනය වූ පැළ බඳුන් ගත කළ හැකිය. ගොම , මතුපිට පස්, කොහුබත් හා රළු වැලි 1: 1: 1 :1 අනුපාතයට මිශ්‍ර කරන්න. එම කි.ග්‍රෑම්. 100කට රොක් පොස්පේට් කි.ග්‍රෑම් 01ක් මිශ්‍ර කර අඟල් 08 X 05 ප්‍රමාණයේ පොලිතීන් බඳුන්වලට පුරවා පැළ සිටුවන්න. මාස 6කට පසු අඟල් 10x12 පොලිතීන් බඳුනකට මාරු කර වසර 1½ දී ක්ෂේත්‍රයේ සිටුවීම සුදුසුය.

## ක්ෂේත්‍රයේ සිටුවීම

පැළ සිටුවීමට මාස 06කට පෙර තාවකාලික සෙවන සඳහා කෙසෙල්, ග්ලිරිසීඩියා හෝ එරබදු සිටුවන්න. සාමාන්‍යයෙන් සාදික්කා ගස් වලින් 50%ක් පිරිමි ගස් වේ. මෙය හැඳිනිය හැක්කේ මල් පිපීමෙන් පසුවය. පීදුනු පසු වගාවේ ගැහැණු ගස් 10 කට පිරිමි ගස් 01ක සංයෝජනයක් සිටින සේ පිරිමි ගස් සියල්ල ඉවත් කරන්න. මෙම ගැටළුව නිසා ඇතැම් රටවල එක් වලක පැළ 03ක් සිටුවා සශ්‍රීක පැළ ඉතිරි කර සියළු දුර්වල ශාක හා පිරිමි ගස් 90% ඉවත් කරයි.

| | |
|---|---|
| පරතරය | අඩි 20 X 20 (අක්කරයකට පැළ 100කි). |
| වලක ප්‍රමාණය | අඩි 2 ½ X 2 ½ X 2 ½ |
| වල පිරවුම් මිශ්‍රණය | ගොම පොහොර, මතුපිට පස් හා රොක් පොස්පේට් ග්‍රෑම් 200යි. |

## වගා නඩත්තුව

වගාවේ පාළු සිටුවීම, වල් මර්ධනය, පාංශු හා ජල සංරක්ෂණ උපක්‍රම යෙදීම හා නඩත්තු කිරීම, සෙවන පාලනය, වසුන් යෙදීම, පොහොර යෙදීම හා රෝග හා පළිබෝධ පාලනය මේ යටතේ සිදු කරයි. වගාවේ මනා නඩත්තුව ඉහළ අස්වැන්නක් හා නිෂ්පාදන වියදම අවම කර ගැනීමට හේතු වේ.

## වල් මර්ධනය හා සෙවන පාලනය

සාදික්කා පැළය අවට අතින් වල් පැළ ඉවත් කරන අතර ඉතිරි වල් වීසිකැතිගෑම කළ යුතුය. මෙම නෙළු වල් සාදික්කා පැළය වටේ දමන්න. ආවරණ බෝග ලෙස කටු රහිත නිදිකුම්බා හෝ "ස්ටයිලොසැන්තස්" බෝගය වගා කළ හැකිය. වගාවේ ඇති සෙවන ද කප්පාදු කරන්න.

- පැළය වටා විශ්කම්භය අඩි 1½ ක වේදිකාවක් සකසන්න. ශාකය විශාල වන විට එය ක්‍රමිකව පුළුල් කරන්න.

## පෝෂක (පොහොර) සැපයීම

වැලේ පාදස්ථයට කොළ රොඩු හා නයිට්‍රජන් බහුල කොළ පොහොර හෝ කොම්පෝස්ට් පොහොර යොදන්න.

## රසායනික පොහොර යෙදීම

යූරියා, රොක් පොස්පේට්, මියුරියේට් ඔෆ් පොටෑෂ් හා කීසරයිට් 6 : 6 : 9 : 1 මිශ්‍රණයෙන් පහත වගුවේ ලෙස යොදන්න.

| වසර | යල (ග්‍රෑම්) | මහ (ග්‍රෑම්) |
|---|---|---|
| මාස 06 | 120 | 120 |
| 02 | 250 | 250 |
| 03 | 375 | 375 |
| 04 | 500 | 500 |
| 05 | 625 | 625 |
| 06 | 750 | 750 |
| 07 | 875 | 875 |
| 08 | 1,000 | 1,000 |
| 09 | 1,125 | 1,125 |
| 10 හා පසුව | 1,250 | 1,250 |

## රෝග හා පළිබෝධ

**සාදික්කා කොළ හැලීමේ රෝගය**

ළපටි පත්‍ර මත කුඩා කළු දුඹුරු පැහැති ලප ඇති වේ. පසුව මෙම ලප විශාලවී පත්‍ර හැලීයයි. මෙලෙස දෙතුන් වරක් පත්‍ර හැලී ඉපල් බේරී අවසානයේ ශාකය මිය යයි.

## රෝග පාලනය

බෝග සනීපාරක්ෂාව - බිම වැටුණු කොළ පුළුස්සා දැමීම, ලෙලි වලදැමීම, මියැදුන ඉපල් කැපීම, සෙවන ඉවත් කිරීම, නිර්දේශිත පොහොර යෙදීම, පාංශු හා ජල සංරක්ෂණය,

## දිලීර නාශක යෙදීම (පත්‍රවලට)

මැන්කොසෙබ් 80% NP (ඩයිතේන් එම් 45) ග්‍රෑම් 10ක් වතුර ලීටර 10 ක දියකර බලවේග යන්ත්‍රයක් මඟින් ආසාදිත පත්‍ර මතට කුඩා ලප අවධියේ හෝ ලා දළුලන අවස්ථාවේ සිට සති 02කට වරක් පත්‍ර මෝරනතුරු මාස 03ක් දක්වා ඉසින්න.

## දිලීර නාශක යෙදීම (කඳට)

බුරුමයක ආධාරයෙන් අඟලක් පමණ ගැඹුරට කඳ විද "ටෙබකොනසෝල්" (ෆොලිකර්) දිලීර නාශකය මි.ලී.7.5ක් (මෙස හැඳි 01ක්) යොදන්න. සිදුර ඉටි හෝ මැටි ස්වල්පයකින් වසා දමන්න. මෙම ප්‍රතිකාරය සති 02කට වරක් මාස 03ක් සිදුකරන්න.

(රෝග මර්දන කටයුතුවල දී ගොවීන් එක්ව ක්‍රියාකිරීම අත්‍යාවශය.)

## පළිබෝධ - කළු පුස් රෝගය

ශාක පත්‍රයේ යුෂ උරා බොමින් ජීවත් වන කොරපොතු කෘමීන් අපද්‍රව්‍ය ලෙස සීනි අධික ද්‍රාවණයක් නිකුත් කරයි. මෙම සීනි ද්‍රාවණය මත ඇතැම් දිලීර වර්ග වර්ධනය වේ. එම නිසා පත්‍ර කළුපැහැ වේ. මෙය කළුපුස් ලෙස හැඳින් වේ.

## පාලනය

මුල් අවස්ථාවේ මෙම කෘමීන් සහිත කොළ / අතු ඉවත් කර විනාශ කරන්න. නැතහොත් "පිෆ්රොනිල් - 50" අඩංගු කෘමිනාශකයක් ජලය ලීටර් 10ක දියකර ශාක පත්‍ර මතට හොඳින් යොදන්න.

මෙම රෝගය කුහුඹියන් මඟින් ව්‍යාප්තවේ. එම නිසා කුහුඹියන් පාලනය කිරීම ද වැදගත් වේ.

## අස්වනු නෙලීම හා සැකසීම

සාමාන්‍යයෙන් අවුරුදු 05 - 07ක් වන විට සාදික්කා ඵල හටගනී. වසර 25ක් වන තෙක් අස්වනු ක්‍රමිකව වැඩි වන අතර අවුරුදු 35 - 40 ක දී උපරිම අස්වැන්නක් ලැබේ. මෙලෙස උපරිම ගෙඩි 8,000 - 10,000ක් අතර ප්‍රමාණයක් එක් ගසකින් ලැබේ.

## සාදික්කා නිෂ්පාදන

සාදික්කා ඇට / මද / වසාවාසි / තෙල් / ලෙලි ජෑම්

## ප්‍රයෝජන

ආහාර පිසීමේ දී කුළුබඩු ලෙස / පුඩිං / කේක් / පේස්ට්‍රි / මස් වර්ග සුවඳවත් කිරීම (කුකුළුමස්, සොසේජස් රස ගැන්වීම) හා සාදික්කා ලෙල්ලෙන් ජෑම් / චට්නි හා මාමලේඩ් / ජෙලි බීම සැදීම.

**විශේෂ උපදෙස් හා තොරතුරු**

- ගසේ මුල් පද්ධතිය පස මතුපිට විහිදී ඇති හෙයින් කොළ රොඩු හෝ කොම්පෝස්ට් පමණක් දමන්න. ගඩොල් / ලී දඬු / පස් ආදිය නොදමන්න.
- බුබුළු සාදික්කා නෙලීමෙන් වලකින්න.
- උද්‍යාන අලංකරනය සඳහා බද්ධ සාදික්කා යොදාගත හැකිය.
- ස්වයං රැකියා ලෙස සාදික්කා නිෂ්පාදන සිදු කළ හැක.
- කෘත්‍රිම වියළුම් යන්ත්‍ර / බීජයේ කටු කඩන යන්ත්‍ර වෙළෙඳපොළෙන් මිල දී ගත හැකිය.
- සාදික්කා පත්‍ර පතන රෝගයට ප්‍රතිකාර කිරීමට අවශ්‍ය කෘෂි රසායන හා ඉසින බලවේග යන්ත්‍ර අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් නොමිලේ සැපයේ.
- ශාක මත ඇති පිලල ආදිය කපා ඉවත් කරන්න.

*අටු කොටු පිරි රටක් - අතමිට සරු හෙටක් සඳහා අපනයන කෘෂි බෝග වවමු.*